මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. වැඩ අධිකාරී (කර්මාන්තශාලා) II ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් :

(1) තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතික පත්‍රය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳව අවුරුදු 04 ක පළපුරුද්ද.

සටහන : තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ අවුරුදු 4 ක පුහුණු කාලසීමාව ඉහත පළපුරුද්දට අදාළ නොවේ.

හෝ

(11) ජාතික තාක්ෂණ සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 10 ක පළපුරුද්ද.

වැටුප් ක්‍රමය :

රු. 39,610 - 6X495, 13X660 - 51,160 (මාසික) U-MT1(I) කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016(v) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

★★ මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

තෝරාගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මගින්.

02. තාක්ෂණික නිලධාරී III ශ්‍රේණිය (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය)

අවශ්‍ය සුදුසුකම් :

(1) අ.පො.ස. (උසස් පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් එක් වරකදී විෂයයන් සියල්ල සමත් වී තිබීම. (විෂයයන් පිළිබඳ අදාළ අධ්‍යයනාංශ විසින් තීරණය කරනු ලැබේ)

හා

(11) තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / තොරතුරු තාක්ෂණය හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද NVQ මට්ටම 05 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සටහන : තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පළපුරුද්ද ඇති අයවළුන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් ක්‍රමය :

රු. 31,625 - 7X300, 10X355 - 37,275/- (මාසික) U-MT1(III) කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016(v) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

★★ මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

තෝරාගන්නා ක්‍රමය : ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

03. පරිපාලක (භූමි දර්ශක) III ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් :

(1)(අ) (i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතුය. සහ

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වසරක කාලයක ප්‍රායෝගික කෘෂිකර්ම පාඨමාලාවක් සාර්ථකව නිමකර තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම.

වැටුප් ක්‍රමය :

රු. 31,625 - 7X300, 10X355 - 37,275/- (මාසික) U-MT1(III A) කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016(v) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

★★ මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන්ද ගෙවනු ලැබේ.

තෝරාගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මගින්.

04. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (පොත් තබන්නා)

අවශ්‍ය සුදුසුකම් :

(1) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පහත සඳහන් විෂයයන් වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් එකවර සමත් වී තිබීම.

(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව

(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය

(iii) ගණිතය සහ

(11) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සියලු විෂයන් එකවර සමත් වීම (පොදු පරීක්ෂණය හැර)

සටහන : පහතින් දක්වා ඇති සුදුසුකම්වලත් අයවළුන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජය භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද.

තනතුරට විශේෂවූ සුදුසුකම් :

ඉහතින් දක්වා ඇති සුදුසුකම්වලට අමතරව විවෘත කාණ්ඩ යටතේ වන අයදුම්කරුවන් පහතින් දක්වා ඇති තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාර්මික විද්‍යාල / තාක්ෂණික විද්‍යාල හෝ පිළිගත් ආයතනයකින් ගිණුම්කරණ තාක්ෂණවේදය පිළිබඳ ජාතික මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

හෝ

(ආ) අ.පො.ස. (උසස් පෙළ) වාණිජ්‍ය විෂය ධාරාවෙන් හදාරා තිබීම.

සටහන : සුදුසුකම් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(ආ) වයස අවුරුදු 18-30 අතර විය යුතුයි.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.

වැටුප් ක්‍රමය :

රු. 30,725 - 17X300 - 35,825/- (මාසිකව) U-MNI (IIIA) කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016(v) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය

★★ මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන්ද ගෙවනු ලැබේ.

තෝරාගන්නා ක්‍රමය : ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

05. වඩු කාර්මික (II ශ්‍රේණිය)

අවශ්‍ය සුදුසුකම් :

(1) කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය.

(11) (අ) ගොඩනැගිලි සහ ගෘහ භාණ්ඩ තැනීමේ කර්මාන්තයෙහි උපයෝගී කරගනු ලබන පිරිද්දුම් පිළිබඳ දැනීම හා ඒවා සකස් කිරීම පිළිබඳ දැනීම.

(ආ) නොයෙකුත් අත්දමේ වඩු වැඩ සඳහා ආවුද පාවිච්චිය, විවිධ දැව වර්ග පිළිබඳ දැනීම හා වඩුවැඩ කර්මාන්තයට අදාළ චිත්‍ර කියවීම පිළිබඳ දැනීම.

(ඇ) අඟලෙන් 1/32 පරිමාණයන් නිවැරදිව කියවීමේ හැකියාව.

(111) වඩු කර්මාන්තය පිළිබඳ අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

සටහන : 07 වැනි ප්‍රමාණය සමත් වූවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් ක්‍රමය :

රු. 29,915 - 16X270 - 34,235 (මාසික) U-PL.3 (III) කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

★★ මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් දීමනාවන්ද ගෙවනු ලැබේ.

තෝරාගන්නා ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

06. පින්තාරු II ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් :

(1) කියවීමට හා ලිවීමට හැකියාව තිබීම.

(11) පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම

(අ) ගොඩනැගිලි ඉදිකිරීමේදී හා තඩත්තු කිරීමේදී කරනු ලබන පින්තාරු වැඩ

(ආ) සියලුම සුප්‍රසිද්ධ සහ සාමාන්‍ය හිමිකම් සහිත පින්තාරු වර්ග, සියලුම වර්ගවල ද්‍රව්‍ය, විවිධාකාර මතුපිටවල් පිළියෙල කර ගැනීම සහ ඉතාම නිවැරදි නිමාවට එනතෙක් තෝරාගත් ද්‍රව්‍ය සියලුම පියවරවලදී නිවැරදි ලෙස යොදා ගැනීම.

(ඇ) විවිධ අත්දමේ මිශ්‍රණයන් සහ පින්තාරු ද්‍රව්‍ය නියමිත පරිදි ගබඩා කර තැබීම.

(ඈ) උපකරණ පාවිච්චිය සහ ඒවායේ පිරිමැස්ම සහිත තඩත්තුව යන කරුණු පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

(111) රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක පින්තාරු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් ක්‍රමය :

රු. 28,025 - 16X270 - 32,345/- (මාසික) UPL 2(III) කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (v) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය.

වයස : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

★★ මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන්ද ගෙවනු ලැබේ.

තෝරාගන්නා ක්‍රමය : යෝග්‍යතා පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහතික කරන ලද අදාළ සහතිකපත් සමග 2020.09.04 වන දින හෝ ඊට පෙර මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී / ආයතන (අනධ්‍යයන) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තවද මේ සඳහා අදාළ ආදර්ශ අයදුම්පත්‍රය මෙම විශ්වවිද්‍යාලයේ ආයතන (අනධ්‍යයන) අංශයේ, සහකාර ලේඛකාධිකාරී තමට ලිපිනය ලියූ රු. 45.00 ක මුද්දර ඇලවූ 25.5 සෙ.මී. X 10 සෙ.මී. ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ www.mrt.ac.lk වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළ යුතු වේ.

ප්‍රමාද වී ලැබෙන අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා වුවද, එම අයදුම්පත නැවත සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

මෙම තනතුරු සඳහා ලිඛිත/ප්‍රායෝගික/වෘත්තීය/යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම්ව සුදුස්සන් බඳවාගනු ලැබේ.

ලේඛකාධිකාරී,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

2020.08.13.